# ප්‍රජා සංවර්ධන කාර්යය සඳහා ගුරුවරුන් සූදානම් කිරීම පිණිස ගුරු අධ්‍යාපන ආයතන මගින් ලබා දෙන පුහුණුවේ ස්වභාවය හා යෝග්‍යතාවය පිළිබඳව සලකා බැලෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

STOCK VERIFICATION

ආර්. එම්. සමන් කුමාරි රණසිංහ

ශාස්ත්‍රවේදී (විශේෂ), පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යාපනපති

UCLIB
509173

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති

උපාධි අවශ්‍යතා පූර්ණය සඳහා ඉදිරිපත් කරනු ලබන

පර්යේෂණ නිබන්ධය

2000 අප්‍රේල් 30

University of Colombo Library Sri Lanka

# සංක්ෂේපය

විසිවන සියවසේ අවසාන භාගය වන විට ගුරු භූමිකාවේ ස්වරූපය පිළිබඳ ව සංකල්පමය පෙරළියක් ඇති වෙමින් තිබුණි. එයට හේතුව ගුරුවරයා සතු සම්ප්‍රදායික ඉගැන්වීමේ කාර්යයට අමතර ව ඔහු ප්‍රජා නායකයෙකු හා ප්‍රජා සංවර්ධකයෙකු ලෙස පිළිගැනීම කෙරෙහි ඇති වූ නැඹුරුතාවයයි. මෙම ප්‍රවණතාවය වැඩි වශයෙන් ම දක්නට ලැබෙන්නේ ආසියාතු හා අප්‍රිකාතු රටවල වීම විශේෂයකි. එම රටවල ජනගහනයෙන් වැඩි ප්‍රතිශතය වූ ග්‍රාමීය ප්‍රජාව අඩු අධ්‍යාපනයකින් යුක්ත වීමත්, එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් අඩු ආත්ම සම්ප්‍රජානනයකින් හා අඩු ආත්ම විශ්වාසයකින් යුක්ත වීමත්, එම රටවල සංවර්ධනය කෙරෙහි බලපෑ ප්‍රධාන බාධකයක් විය එම තත්ත්වය මගහැර සංවර්ධන ක්‍රියාවලිය කෙරේ ග්‍රාමීය ප්‍රජාව යොමු කරවා ගැනීමට අදාළ රටවල රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන කොතෙක් උත්සාහ ගත්ත ද අපෙක්ෂිත ප්‍රතිඵල නොලැබිණි. අවසානයේ ග්‍රාමීය ප්‍රදේශවල පාසල් ගුරුවරුන්ගේ දායකත්වය මේ සඳහා ලබා ගැනීම කෙරෙහි ද සැලසුම්කරුවන්ගේ අවධානය යොමු විය.

ඒ අනුව යමින් ගුරු භූමිකාව තුළ මෙම මූලික සංකල්පමය වෙනස ප්‍රායෝගික ව අත්හදා බැලූ රටවල් කිහිපයකට නිදසුන් ලෙස කැමරූන්, ඉතියෝපියාව, අයිවරි කෝස්ට්, ලයිබීරියාව, නයිජර්, ටොංගෝ, සියාරාලියොන් වැනි අප්‍රිකාතු රටවල් මෙන් ම ඉන්දියාව, තායිලන්තය, පිලිපීනය, කොරියාව වැනි රටවල් ද දැක්විය හැකි ය.

ගුරුවරයාට ක්ෂෙත්‍රයට පිවිසීමට පෙර ප්‍රජා සංවර්ධන කටයුතු කෙරෙහි විධිමත් පුහුණුවක් ලබා දිය යුතු බවත්, එම පුහුණුව ගුරු අධ්‍යාපන ආයතන මගින් පූර්ව සේවා වශයෙන් හෝ සේවාස්ථ වශයෙන් ලබාදීම යෝග්‍ය බවත් යුනෙස්කෝ ආයතනයේ හා සංවර්ධනය වෙමින් පවතින රටවල අදහසයි.

ශ්‍රී ලංකාවේ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ගුරු විද්‍යාලයක් සම්බන්ධ වූ මුල් ම අවස්ථාව ලෙස ගැනෙන්නේ හිඟුරක්ගොඩ ගුරු විද්‍යාලය මගින් 1975 දී දියත් කරන ලද ව්‍යාපෘතියයි. මෙයින් පසු එහි වැදගත්කම තේරුම් ගත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු විද්‍යාල ශාඛාව 1977 සිට ක්‍රියාත්මක වන පරිදි ගුරු පුහුණු විෂය මාලාවේ එක් අංශයක් ලෙස "ප්‍රජා අධ්‍යාපනය" හඳුන්වා දෙන ලදී. එමෙන් ම 1985 දී පූර්ව සේවා ගුරු පුහුණු ආයතන ලෙස ඇරඹුනු අධ්‍යාපන විද්‍යා පීඨයන්හි

විෂයමාලාවට ද "පාසල හා ප්‍රජාව" නමින් මෙම විෂය හා ව්‍යාපෘති මාලාව ඇතුළත් කෙරිණි.

1998 වන විට ගුරු විද්‍යාලවල ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කර අවුරුදු 20 කි. අධ්‍යාපන විද්‍යා පීඨවල එය අවුරුදු 12ක් සම්පූර්ණ කර ඇත. වර්තමානයේ ගුරු අධ්‍යාපන ආයතනවල ව්‍යුහයන් හා විෂයමාලාවන් ප්‍රතිසංස්කරණයට භාජනය වෙමින් පවතී. අනාගත ගුරු අධ්‍යාපන ආයතන සඳහා විෂයමාලාවන් සම්පාදනය කිරීමේ දී රටට ගැලපෙන බව හා ඵලදායීතාවය පිළිබඳ ව සලකා බැලීමට සිදු වේ. මේ නිසා මෙතෙක් ගුරු අධ්‍යාපන ආයතනවල ක්‍රියාත්මක වූ විෂයයන්ගේ යෝග්‍යතාවය සලකා බැලීම වැදගත් වේ. එනිසා මෙතෙක් ගුරු අධ්‍යාපන ආයතනවල ක්‍රියාත්මක වූ ප්‍රජා සංවර්ධන විෂයය හා ව්‍යාපෘතිවල ස්වභාවය හා යෝග්‍යතාවය පිරික්සා බැලීමට මෙය ඉතාමත් සුදුසු අවස්ථාවයි.

ගුරු විද්‍යාල හා අධ්‍යාපන විද්‍යා පීඨ යන ගුරු අධ්‍යාපන ආයතන වර්ග දෙකෙහි ක්‍රියාත්මක වූ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිවල ස්වභාවය හා ඒ ඇසුරින් ප්‍රජා සංවර්ධනය සම්බන්ධ ව ගුරු සිසුන් තුළ ප්‍රතිජනනාත්මක ලෙස ප්‍රජානන, ආවේදන හා මනෝචාලක වෙනසක් ඇති වූයේ ද යන්න මෙම පර්යේෂණයෙන් සොයා බලන ලදී. ඒ සඳහා මෙම විෂයයේ දේශන පැවැත්වීමෙන් හා දේශනවලට සහභාගිවීමෙන් ද සැලසුම් කිරීමෙන් සංවිධානයෙන්, මෙහෙයවීමෙන් හා ඇගයීමෙන් ව්‍යාපෘතිවලට සම්බන්ධ වූ ගුරු අධ්‍යාපන ආයතන ප්‍රධානීන් කථිකාචාර්යවරුන් හා ගුරු සිසුන්ගෙන් ද අදහස් ලබාගෙන ඒවා විමර්ශනයට බඳුන් කරනු ලැබිණි.

අදාළ ආයතනවල ප්‍රජා සංවර්ධන විෂයය නිර්දේශයේ දක්වා තිබූ ආරම්භක අරමුණු ප්‍රජා සංවර්ධන විෂයය ක්‍රියාත්මක වූ ආකාරයේ යෝග්‍යතාවය විමසා බැලීම සඳහා නිර්ණායක ලෙස යොදාගන්නා ලදී.

මෙමගින් ගුරු විද්‍යාලවල හා අධ්‍යාපන විද්‍යාපීඨවල ප්‍රජා සංවර්ධන විෂයයට අදාළව ලබා දෙන ලද ගුරු පුහුණුවේ අවශ්‍යතාවය හා වැදගත්කම හඳුනාගන්නා ලදී. ඊට අමතරව ක්‍රියාත්මක වූ විෂයයෙහි හා ව්‍යාපෘතිවල අඩුපාඩු හා ගැටළු නිරාවරණය කරගනු ලැබිණි. එසේම එම අඩුපාඩු වලක්වා මෙම විෂයය හා ව්‍යාපෘති වැඩසටහන් වඩාත් සාර්ථක කර ගැනීම සඳහා ක්ෂේත්‍රයේ අත්දැකීම් පදනම් කරගෙන යෝජනා මාලාවක් ද ඉදිරිපත් කර ඇත.